# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදාහැරීමේ ප්‍රමුඛතම ආයතනය ද වේ.

අප ආයතනය පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. කළමනාකරණ සහකාර (ඖෂධවේදී) (MA 2.1) III වන ශ්‍රේණිය

<u>වෘත්තීය සුදුසුකම්</u>

(අ) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරන ලද ඖෂධවේදියකු ලෙස වූ ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ලියාපදිංචි සහතිකය සමග, රජයේ/ සංස්ථාවක/ මණ්ඩලයක/ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයකට අයත් ලියාපදිංචි ඔසුහලක ඖෂධ සංයෝජක කාර්යයන්හි අවම වශයෙන් වසර එකක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

සහ

(ආ) පරිගණක සාක්ෂරතාවය

වැටුප් පරිමාණය : රු. 37,890/- 375/- x 10¸ 440 /- x 7, 620/- x 4, 825/- x 20 - 63,700/-
(දළ මාසික වේතනය රු. 115,914/- ක් පමණ වේ)

වයස් සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

### 2. කළමනාකරණ සහකාර (මුදල් භාරකරු) (MA 1.1) III වන ශ්‍රේණිය

<u>සුදුසුකම්</u>

(අ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන්, දෙවරකට නොවැඩි වාර ගණනකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය/ වාණිජ අංක ගණිතය හා තවත් එක් විෂයයක් ඇතුළත්ව විෂයයන් 04 කට සම්මාන සහිතව විෂයන් 06 කින් සමත්ව සිටිය යුතුය.

සහ

(ආ) I. අ.පො.ස (උ/පෙළ) (නව විෂය නිර්දේශය) විභාගයෙන්, (පොදු ප්‍රශ්ණ පත්‍රය හැර) වාණිජ අංශයෙන් අවම වශයෙන් විෂයයන් 02 කින් සමත්ව සිටිය යුතුය.

හෝ

II. අ.පො.ස (උ/පෙළ) (පැරණි විෂය නිර්දේශය) විභාගයෙන්, වාණිජ අංශයෙන් විෂයයන් 03 ක් සමත්ව සිටිය යුතුය.

සහ

(ඇ) පරිගණක සාක්ෂරතාවය

සහ

(ඈ) රජයේ / සංස්ථාවක / මණ්ඩලයක / ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අයකැමිවරයෙකු ලෙස, අවම වශයෙන් වසර 03 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

වැටුප් පරිමාණය : රු. 34,890/- 375 /- x 10¸ 440/- x 7¸ 620/- x 4¸ 825/- x 20 - 60,700/-
(දළ වශයෙන් මාසික වේතනය රු. 110,458/- ක් පමණ වනු ඇත)

වයස් සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

## 3. කළමනාකරණ සහකාර (ලිපිකරු) (MA 1.1) III වන ශ්‍රේණිය

**<u>සුදුසුකම්</u>**

(අ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන්, දෙවරකට නොවැඩි වාර ගණනකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය හා තවත් එක් විෂයයක් ඇතුළත්ව විෂයයන් 04 කට සම්මාන සහිතව විෂයන් 06 කින් සමත්ව සිටිය යුතුය.

සහ

(ආ) I. අ.පො.ස (උ/පෙළ) (නව විෂය නිර්දේශය) විභාගයෙන්, (පොදු ප්‍රශ්ණ පත්‍රය හැර) අවම වශයෙන් විෂයයන් 02 කින් සමත්ව සිටිය යුතුය.

හෝ

II. අ.පො.ස (උ/පෙළ) (පැරණි විෂය නිර්දේශය) විභාගයෙන්,විෂයයන් 03 ක් සමත්ව සිටිය යුතුය.

සහ

(ඇ) පරිගණක සාක්ෂරතාවය

වැටුප් පරිමාණය : රු රු. 34,890/- 375 /- x 10, 440/- x 7, 620/- x 4, 825/- x 20 - 60,700/-
(දළ වශයෙන් මාසික වේතනය රු. 110,458/- ක් පමණ වනු ඇත)

වයස් සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

**ආයතනික ප්‍රතිලාභ :**

තෝරා ගත් අයදුම්කරුවන් හට මාසික පැමිණීමේ දිරි දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය, වාර්ෂික ප්‍රසාද දීමනා, සමාජයීය ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ හා සේවකයා හා පවුලේ අය සඳහා රෝහල්ගත වීමේ වෛද්‍ය රක්ෂණාවරණය ඇතුළු ප්‍රතිලාභ රැසක් හිමි වේ.

**අයදුම්පත් යොමු කළ යුතු අකාරය**

- සියලුම අයදුම්කරුවන් ප්‍රථමයෙන් තම අයදුම්පත් **2026.02.09** දින හෝ ඊට පෙර මාර්ගගත පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා අයදුම්කරුවන් එක් එක් තනතුරට අදාළ පහත සඳහන් කර ඇති වෙබ් සබැඳීන් වෙත පිවිසිය යුතුය. මාර්ගගත අයදුම්පත් ක්‍රියාවලිය **<u>2026.01.25</u>** දින සිට විවෘත වන අතර **2026.02.09** දිනෙන් අවසන් වේ. **(www.SPC.lk නිල වෙබ් අඩවියේ Careers වෙත ගොස් මෙම ප්‍රවේශය හා සම්බන්ධ විය හැකිය. ඒසේ නැතහොත් මේ සමග දක්වා ඇති QR කේතය හරහාද අදාල ප්‍රවේශය හා සම්බන්ධ විය හැකිය.)**

**කළමනාකරණ සහකාර (ඖෂධවේදී) (MA 2.1)** https://forms.gle/V8jRDZDS7h5263X28

**කළමනාකරණ සහකාර (මුදල් භාරකරු) (MA 1.1)** https://forms.gle/mnyA5k1X2VVjBTBD8

**කළමනාකරණ සහකාර (ලිපිකරු) (MA 1.1)** https://forms.gle/YcsdiVAYBnRxv1hVA

- පහත සඳහන් පරිදි ඉල්ලුම් කරන තනතුරට අදාල නැවත නොගෙවන ගාස්තු ගෙවීම් සිදු කර අදාල රිසිට් පත PDF/JPG අකාරයෙන් ඉහත මාර්ගගත (Online) ක්‍රමයට අයදුම්පත් යොමු කිරීමේදී අමුණා තැබීම සිදු කළ යුතුය.

**කළමනාකරණ සහකාර (ඖෂධවේදී) (MA 2.1) - රු. 2300/-**
**කළමනාකරණ සහකාර (මුදල් භාරකරු) (MA 1.1) - රු. 1675/-**
**කළමනාකරණ සහකාර (ලිපිකරු) (MA 1.1) - රු. 1600/-**

ගෙවීම් සිදු කළ යුතු ගිණුම් විස්තර

| | | |
|---|---|---|
| Name of Account Holder | : | State Pharmaceuticals Corporation of Sri Lanka |
| Bank and Branch | : | National Savings Bank, Narahenpita |
| Account No. | : | 1-0064-04-01196 |

- අයදුම්පත මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමු කළ පසු එය <u>**තම විද්‍යුත් තැපැල හරහා**</u> බාගත කර අදාල දෘඩ පිටපත (යොමු අංකය සහිත), ගෙවීම් තහවුරු කිරීමේ රිසිට්පත/කුවිතාන්සියද සමගින් **"වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන), ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, "මෙහෙවර පියෙස", 16 වන මහල, නො. 41, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05"** ලිපිනයට ලියුම් කවරයක බහා වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර ලියාපදිංචි තැපැලෙන් අධ්‍යාපන/සේවා/වෘත්තීය සහතික වල පිටපත් සමගින් යොමු කළ යුතුය.

- දෘඩ පිටපත් යොමු කිරීමේදී රාජ්‍ය/සංස්ථා/මණ්ඩල/ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවය කරනු ලබන අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු/අංශ ප්‍රධානින් මගින් අයදුම්පත් යොමු කිරීමට කටයුතු කළ යුතුය.

- අදාල ගෙවීම් සිදු කිරීමේදී අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සෑම අයදුම්කරුවකු විසින්ම ගෙවීම් සිදු කරනු ලබන කුවිතාන්සියේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

- **ඉහත ක්‍රමවේදයෙන් බැහැරව යොමු කරනු ලබන සෑම අයදුම්පතක්ම ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් බව සඳහන් කරමි.**

- අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් නොකිරීමට වග බලා ගත යුතුවේ.

- අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එහි සඳහන් වන තොරතුරු කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ පූර්ණ වගකීම වේ.

- අයදුම්පතේ මුද්‍රිත පිටපතේ සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ

**පොදු කොන්දේසි**

- සෑම අයදුම්කරුවකුම විශිෂ්ඨ චරිතයකින් සහ විනයානුකූල ක්‍රියාමාර්ගයකින් වරදකරුවකු නොවූ අයෙකු විය යුතුය

- යම් අයදුම්කරුවකු පුරප්පාඩු කිහිපයක් අයදුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.

- ඉල්ලුම්කරන තනතුරට අදාල කාර්යභාරය මැනවින් ඉටු කිරීමට හැකි, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් හෙබි විය යුතුය.

- අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අයදුම්පත් කැඳවීමෙන් පසුව ඒ ඒ තනතුරට අදාල වන පරිද වූ ලිඛිත තරඟ විභාගයක් හා රාජ්‍ය ඖධෂ නිතීගත සංස්ථාව විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන),
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,
"මෙහෙවර පියෙස", 16 වන මහල, නො. 41,
කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.
දූරකථන අංකය 0112 320 356 -9